# සංවරණ හා තුලන ක්‍රමය නොසලකා

# ව්‍යවස්ථා සංශෝධනය කළ සෑම අවස්ථාවකම එකී ආණ්ඩු මහජන අප්‍රසාදයට පත් වුණා

**පැෆරල් විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි**



**ජේ.ටී. ද සිල්වා**

නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී පාලන රටාවක් ක්‍රියාත්මක ලංකාවේ සංවරණ හා තුලන ක්‍රමය නොසලකා ව්‍යවස්ථා සංශෝධනය සිදුකළ සෑම අවස්ථාවකම එකී ආණ්ඩු මහජන අප්‍රසාදයට ලක්වූ අතර, රට තුළ අර්බුදකාරී තත්ත්වයක්ද නිර්මාණය වූ බව පැෆරල් සංවිධානය නිකුත් කළ නිවේදනයක සඳහන් කරයි.

එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චිගේ අත්සනින් නිකුත් කර ඇති එම නිවේදනයෙහි මෙසේද දැක්වෙයි.

ජනාධිපතිවරණයේදීත් පාර්ලිමේන්තු මැතිවරණයේදීත් වත්මන් රජයට පැහැදිලි ජනවරමක් හිමිවූ අතර 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීමද ඔවුන්ගේ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තුළ ප්‍රධාන මාතෘකාවක් විය. ඒ අර්ථයෙන් සැලකීමේදී 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීම ජනවරමට අනුව යෑමකි. එහෙත් 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කර ගෙන එන ඕනෑම සංශෝධනයකට ජනතා වරම ලබාදී නැති බව අවබෝධ කර නොගතහොත් ජනතා අප්‍රසාදයට ලක්වීම නොවැළැක්විය හැකිය. ඒ අනුව 20 ව්‍යවස්ථා සංශෝධනය සිදු කිරීමේදී ඉතා ප්‍රවේශමෙන් ජනතා අභිලාශය අනුව තීරණ ගත යුතුව ඇත.

පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් හා විශේෂයෙන්ම රජය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින්නේ 20 වැනි ව්‍යවස්ථා සංශෝධනයට අත එසවීමට පෙර එය නැවත නැවතත් කියවා බලන ලෙසයි. ජනතාව වෙනුවෙන් ජනතා පරමාධිපත්‍ය ආරක්ෂා කිරීමට බැඳී සිටින ඔබ මේ මොහොතේ ගනු ලබන තීරණ ඔබේ දේශපාලනයත් අපේ රටේ අනාගතයත් තීරණය කරන බැවින් 20 ව්‍යවස්ථා සංශෝධනයේ ඇති සාධනීය කරුණු මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයට නොගැළපෙන කරුණු සාකච්ඡා කර සංශෝධනය කරන ලෙසයි.

පැෆරල් සංවිධානය 20 වැනි සංශෝධනයේ ඉතා බරපතළ කරුණු 22ක් හඳුනාගෙන ඇති අතර, ස්වාධීනව පැවැතිය යුතු ආයතන දේශපාලනීකරණයට ලක්වීම ඒ අතර ප්‍රධාන තැනක් ගනු ලබයි. විශේෂයෙන්ම මැතිවරණ කොමිසමේ සාමාජිකයන් පත්කිරීම, මැතිවරණ කාලය තුළ රාජ්‍ය සේවයේ පත්වීම්, මාරුකිරීම්, උසස් කිරීම් හා රාජ්‍ය දේපොළ අවභාවිතය වැළැක්වීමට තිබූ බලතල ඉවත් කිරීම බරපතළ තත්ත්වයකි. අනාගතයේ කැබිනට් මණ්ඩලයේ උපදෙස් මත රාජ්‍ය සේවා කොමිසම විසින් මැතිවරණ කාලය තුළ නිලධාරීන් මාරු කළහොත් මැතිවරණ කොමිෂන් සභාව අර්බුදයකට යනු ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථා සංශෝධනය හරහා රාජ්‍ය සමාගම් විගණනය කිරීමට විගණකාධිපතිවරයාට තිබූ අයිතිය අහිමි කිරීම හරහා රාජ්‍ය මූල්‍ය පාලනයට පාර්ලිමේන්තුවට තිබූ වගකීම හා අයිතිය අහිමි කර ඇත. එමඟින් ශ්‍රී ලංකා ගුවන් සමාගම, ලිට්‍රෝ සමාගම, සීනි සමාගම්, විදුලි සමාගම් වැනි රාජ්‍ය මුදල් බිලියන ගණනින් හුවමාරු වන රාජ්‍ය සමාගම් 100ට වැඩි ප්‍රමාණයක් පිළිබඳව ජනාධිපතිවරයාට හා පාර්ලිමේන්තුවට දැනගැනීමට තිබූ අයිතියද යෝජිත 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා අහිමි වී ඇත.

මෙම කෙටුම්පතෙහි නැවැත සංශෝධනය විය යුතු ප්‍රධාන කරුණු අතර ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කිරීම, ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුතුය යන ප්‍රතිපාදනය අහෝසි කිරීම, ඇමැති ධුර සංඛ්‍යාවට තිබූ සීමා ඉවත් කිරීම, වසරක් අවසන් වීමෙන් පසු පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට බලය ලැබීම, විදේශ පුරවැසිභාවය සහිත පුද්ගලයන්ට ජනාධිපති මැතිවරණයට හා පාර්ලිමේන්තු මැතිවරණයට තරග කිරීමට ඉඩ ලබාදීම පෙන්වාදිය හැකිය.

යහපත් දේශපාලන සංස්කෘතියක් ගොඩනැඟීම තේමා කරගනිමින් පාර්ලිමේන්තුවට පත්වූ උගත් බුද්ධිමත් නවක මන්ත්‍රීවරුන්ගේ වගකීම වනුයේ පාර්ලිමේන්තුවේ නීති සම්පාදන වගකීම මැනැවින් වටහාගෙන හෘද සාක්ෂියට එකඟව සාම්ප්‍රදායික මන්ත්‍රීවරුන්ට ආදර්ශවත්ව හා මඟ පෙන්වීමක් වන සේ මෙම ව්‍යවස්ථා සංශෝධනයේදී කටයුතු කිරීමයි.

එබැවින් අප ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත්, පක්ෂ නායකයන්ගේ සහ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින්නේ දේශපාලන කඳවුරුවලින් බැහැරව 20 ව්‍යවස්ථා සංශෝධනය තුළ අන්තර්ගතව ඇති සාධනීය හා නිශේධනාත්මක කරුණු පිළිබඳව මනා අධ්‍යයනයක් සිදුකර, නව කෙටුම්පතක් සකස් කිරීම හෝ කාරක සභා අවස්ථාවේදී සුදුසු සංශෝධන සහිතව සම්මත කරගන්නා ලෙසයි.